චක්‍රලේඛ අංක: ..22..... /2016

මගේ අංක: කේ/05/05/බන්ධ:කො:චක්‍රලේඛ/2016
බන්ධනාගාර මූලස්ථානය
කොලඹ 09
2016.09.05

සියළුම බන්ධනාගාර අධිකාරීන්
සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත.

<u>**එළිමහන් සිර කඳවුරු වලට , වැඩ කඳවුරු වලට හා අඖෂධපුස්ස පබෝදා මෙත් සෙවන වෙත සිරකරුවන් මාරු කිරීම.**</u>

සිරකරුවන් මාරු කිරීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වූ අංක: 35/95 හා 1995.09.11, 06/02 හා 2002.01.21, 05/2008 හා 2008.01.21, 28/2012 හා 2012.11.01, 44/2013 හා 2013.12.05 යන චක්‍රලේඛය මින් අවලංගු කරමි.පහත සඳහන් පරිදි සිර දඬුවම් කාලයක් ඇති සිරකරුවන් එළිමහන් කඳවුරු හා වැඩ කඳවුරු වලට මාරු කල යුතු බවට මෙයින් නියෝග කරමි.

01. මාස 06 ට අඩු දඬුවම් නියම වූ සිරකරුවන් ගෘහසේවය සඳහා පමණක් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ඇතුලත් කරන බන්ධනාගාරයේම රඳවා ගත හැකිය. අනෙක් සිරකරුවන් දෙපාර්තමේන්තු නියාය නියෝග අනුව අදාල බන්ධනාගාර වලට මාරු කල යුතුය.

02. වසර 04 දක්වා සිර දඬුවම් නියම කරන ලද කඳවුරු සේවය සඳහා සුදුසු සිරකරුවන් එළිමහන් සිර කඳවුරු හා වැඩ කඳවුරු වෙත මාරු කල හැකි අතර, දීර්ඝ කාලීන සිරකරුවන්ගේ ඉතිරි සිර දඬුවම් කාලය වසර 05 දක්වා වන විට ඔවුන් පල්ලෙකැලේ හා අනුරාධපුර බන්ධනාගාර වෙත මාරුකල හැකිය.මෙසේ කඳවුරු වෙත මාරු කිරීමට ප්‍රථම ඔබගේ නිර්දේශය සහිතව බන්ධනාගාර කොමසාරිස් (මෙහෙයුම්) ගේ අනුමැතිය ලබා ගත යුතුය.

03. මත් ද්‍රව්‍ය භාවිතා කර මාස 03 සිට වසර 01 ක් දක්වා සිර දඬුවම් නියම වූවන් අඖෂධපුස්ස පබෝදා මෙත් සෙවන ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය වෙත මාරු කල යුතුය.මෙසේ මාරු කිරීමට ප්‍රථම අඖෂධපුස්ස අධිකාරීවරයා සමග ප්‍රමාණවත් ඉඩ පහසුකම් ඇත්දැයි විමසා බන්ධනාගාර කොමසාරිස් (මෙහෙයුම්) ගේ අනුමැතිය ලබා ගත යුතුය.

04. මාස 06 ට වැඩි යම් සිරකරුවකු සේවා අවශ්‍යතාවය මත රිමාන්ඩ් බන්ධනාගාරයක රඳවා ගැනීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා බන්ධනාගාර කොමසාරිස් (මෙහෙයුම්) මගින් පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

එච්.එම්.එන්.සී.ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.